# 22. සාමුවෙල්

අද අප අධ්‍යයනය කරන්නේ දෙවියන් වහන්සේගේ හඬ තමාට ඇසුනු ලාබාල දරුවකු ගැන ය. දෙවි පියාගේ දරුවකු වන ඔබට, කවදා හෝ උන්වහන්සේගේ හඬ ඇසුණු විට, ඊට සවන් දී ප්‍රතිචාර දීමට මෙම පාඩමෙන් ඔබට අවබෝධයක් ලැබෙනු නිසැක ය. ඔබ වයසින් වැඩෙන අතර ඉගෙනීමේ කටයුතුවල නිරත වන අතර සමිඳාණන් වහන්සේ ගැන ද දැන ගැනීමට වෑයම් කරන්න. උන්වහන්සේ හා සබඳතාවයක් ගොඩ නගා ගත් විට උන්වහන්සේගේ හඬට සවන් දීමට අනගි අවස්ථාවක් උදාවීම නොඅනුමාන ය.

**කියවා බලමු**

**1 සාමුවෙල් 3: 1-10**



ජුදෙව් පවුලක් වූ එල්කානා හා හන්නා, රාමා හී විසූ හ. හන්නාට දරුවන් නොලැබුණු නිසා දැඩි සිත් වේදනාවෙන් කල් යැවී ය. අවුරුදු පතා ශීලෝහි දෙවියන් වහන්සේගේ මැදුරට ගොස් පූජාවන්ට සහභාගී වීම මොවුන් අත පසු කළේ නැත. එක අවස්ථාවක දී මෙම වතාවත් සඳහා ගිය විට හන්නා ඉතා ඕනෑ කමින් ගැඹුරු විශ්වාසයෙන් කඳුළු සලමින් යාච්ඤාවක් ඔප්පු කළා ය. යැදුම වූයේ දෙවියන් වහන්සේගෙන් පිරිමි දරුවකු ලබා ගැනීමට ය. ඒ සමග ඇය පොරොන්දුවකින් බැඳුණි. එනම් එම දරුවාගේ මුළු ජීවිත කාලය ම දෙවිඳුන්ගේ සේවයට කැප කිරීමට ය. ඇගේ හදවතින් ගලා ආ යාච්ඤාවේ ස්වරූපය දුටු ශීලෝ මැදුරෙහි ඒලී පූජකතුමා දෙවිඳාණන් ඇයගේ යැදුමට පිලිතුරු දෙන බවට පොරොන්දුවක් දුන්නේ ය.

එම බලාපොරොත්තුව එලෙස ම ඉටු විය. හන්නා තම පුතුට සාමුවෙල් යන නම තැබී ය. එහි අරුත **"දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත්"** යනු යි. හන්නා දුන් පොරොන්දුව අනුව ලාබාල වියේහී දී ම ශීලෝ හි දෙව් මැදුරේ සේවයට දරුවා කැප කළා ය. වාර්ෂික ව තම පුතා බැලීමට හන්නා ශීලෝ

කරා ගියා ය. ඒලී පූජකතුමාගේ රැකවරණය තුළ දේව භය ඇති ව සාමුවෙල් වැඩුණි.

එක් රැයක ඒලී පූජකතුමා සිය කාමරයේ සැතපී සිටි අතර සාමුවෙල් දරුවා ගිවිසුම් කරඬුව තැන්පත් කර තිබූ ශුද්ධ ස්ථානයේ නිදා සිටියේ ය. එහි පහන දැල්වෙමින් තිබුණි. (දසපනත තැන්පත් කර තිබුණේ ගිවිසුම් කරඬුව තුළය.) එවිට හඬක් . . . .

සමිඳාණන් වහන්සේ: සාමුවෙල්, සාමුවෙල්,
(දරුවා නැගිට, විගස දුව ගියේ ඒලී පූජකතුමා තමාට හඬ ගසන බව සිතමිනි. )

සාමුවෙල්: මම මෙහි ය. ඔබ මට අඬ ගැසුවෙහි ද?

ඒලී පූජකතුමා: මම ඔබට අඬ නොගැසීමි; නැවත ගොස් නිදා ගන්න.

සමිඳාණන් වහන්සේ: සාමුවෙල්, සාමුවෙල් ( දෙවන වරට )

( සාමුවෙල් නැගිට ඒලී පූජකතුමා ලඟට ගොස්)

සාමුවෙල්: ඇත්තටම ඔබ මට අඬ ගැසුවෙහි ය. මෙන්න මම මෙහි ය.

ඒලී පූජකතුමා: මගේ පුත්‍රය, මම ඔබට අඬ නොගැසීමි. නැවත ගොස් නිදා ගන්න.

සමිඳාණන් වහන්සේ: සාමුවෙල්, සාමුවෙල් ( තෙවන වරට )
(සාමුවෙල් නැවත ඒලී පූජකතුමා ලඟට ගොස්)

සාමුවෙල්: ඔබ මට කථා කළෙහි ය. මෙන්න මම මෙහි ය.

(මෙම අවස්ථාවේ දී පූජකතුමා තේරුම් ගත්තේ සමිඳාණන් වහන්සේ සාමුවෙල් අමතන බව ය.)

ඒලී පූජකතුමා: ඔබ ගොස් නිදාගන්න. ඔබට නැවත එසේ අඬගැසුවොත්, මෙලෙස කියන්න "සමිඳාණන් වහන්ස, කථා කළ මැනව; ඔබවහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා.

සමිඳාණන් වහන්සේ: සාමුවෙල්, සාමුවෙල්

සාමුවෙල්: "කතා කළ මැනව; ඔබවහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා" යි පැවසී ය.

සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට දැනුම් දුන්නේ පූජක ඒලීගේ පුතුන්ගේ අයහපත් හැසිරීම් රටාවත් උන්වහන්සේගේ අනාගත සැලසුමත් පිළිබඳ ව ය. සාමුවෙල් දේව හඬට සවන් දුන් ආකාරය දැන් පැහැදිලි ය.

**සාමුවෙල් තුන් වතාවක් ම ඒලී පූජකතුමා වෙතට යාම, එතුමාට කීකරු ව ඇහුම්කන් දී අවවාද පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීම අපට ආදර්ශයකි.**

**මෙම සිද්ධිය තුළින් අපට ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත.**

- ❖ හන්නා තම ආදරණීය පුත්‍රයා ජීවිතාන්තය දක්වා දේව සේවයට කැප කළා ය.
- ❖ බාල වියෙහි සිට සාමුවෙල් දේව අභිමුඛත්වයේ ඇති දැඩි විය.
- ❖ දෙවියන් වහන්සේගේ කැඳවීමට වයස් සීමාවක් නැත.
- ❖ උන්වහන්සේගේ හඬට සවන් දීමට නිරන්තරයෙන්ම සූදානම් ව සිටිය යුතු වේ.
- ❖ අපට නිසි ලෙස තේරුම් ගත නොහැකි දේ දැන ගැනීමට වැඩිහිටියන්ගේ පිහිට පැතීම යහපත් වේ.
- ❖ මව්පියන්, පූජකවරු, ගුරුවරුන්ගේ අවවාද, අනතුරු ඇඟවීම්වලට ඇහුම්කන් දිය යුතු වේ.
- ❖ දේව වචනය වටහා ගැනීම දිනපතා යාච්ඤාවේ යෙදීම, දේව නමස්කාරයට සහභාගී වීම දෙවියන් වහන්සේ දේව දරුවන්ගෙන් බලාපොරොත්තු වේ.
- ❖ දේව හඬ ශ්‍රවණය කළ විට නිහතමානී ව බැහැපත් ව ස්තුතිවන්ත ව යටත් විය යුතු වේ.

ලාබාල වයසෙහි පසු වූ සාමුවෙල්ට කථා කළ දෙවියන් වහන්සේ උන්වහන්සේ සැලසුම් ඉදිරියට ගෙන යන්නට ඔබ වැනි දේව දරුවන් සූදානම් කරන සේක. උන්වහන්සේ කැඳවන කුමන සේවයකට වුව ද ඵලදායී ප්‍රතිචාර දැක්වීම අපගේ  වගකීම හා යුතුකම ය.

**කටපාඩම් කරමු.**
**1 සාමුවෙල් 3:10**

ක්‍රියාකාරකම

1. සාමුවෙල් යන නාමයේ අර්ථය ලියා එම නම ලැබුණේ කෙසේ දැයි පහදන්න.

2. දේව හඬ අපට ඇසෙන මාර්ග තුනක් ලියා දක්වන්න.